# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 56 — 1973 අප්‍රේල් 19 වැනි බ්‍රහස්පතින්ද — 1973.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 507 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම ... ... | 513 | රට ඔිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 513 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| තොට්ටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 515 | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත 1973 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

**හිස් තාර පීප්ප සහ සිමෙන්ති මළු විකිණීම සහ ඉවත් කිරීම**

වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ නැගෙනහිර දිසාවේ ප්‍රාදේශීය සේවා සිවිල් ඉංජිනේරු සංවිධානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්—

1. හිස් තාර පීප්ප

2. හිස් සිමෙන්ති මළු

විකිණීම හා ඉවත් කිරීම සඳහා ලාංකිකයන්ගෙන් හා ලාංකික ආයතනවලින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසාන වනුයේ 1973. 05. 03 දින පෙරවරු 10 ට වේ. රුපියල් 100 ක මුදලක් මෙම කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු 1973. 04. 28 දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර්පත් භාර ගත හැක.

3. ටෙන්ඩර් විවෘත කිරීම 1973. 05. 03 දින අපර භාග 2 ට නැගෙනහිර දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේදී සිදු කරනු ඇත. මෙම අවස්ථාවේ ටෙන්ඩර්කරුවනට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

4. මෙම ටෙන්ඩරයේ කාල සීමාව 1973. 12. 31 වෙනි දිනට අවසන් වේ.

5. වැඩිදුර විස්තර මඩකලපුවේ නැගෙනහිර දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැක.

එස්. ජී. සාමෝදරම්,
වැඩ අධ්‍යක්ෂ, නැගෙනහිර දිසාව.

1973 මාර්තු මස දින,
නැගෙනහිර දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
මඩකලපුව.

4–452—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

*

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

**ලොරි ට්‍රැක්ටර්, ට්‍රේලර් හා වෙනත් උපකරණවලට කුලී ගාස්තු නියම කරගැනීම හා එක් එක් සේවා සඳහා නියම කරගත් ගාස්තු අනුව කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ටෙන්ඩර්**

වාරිමාර්ග විදුලිබල හා මහා මාර්ග අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ වයඹ දිසාවේ දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 මැයි මස 1 වැනි දින සිට මාස 8 ක කාලයක් සඳහා ලොරි, ට්‍රැක්ටර්, ට්‍රේලර්, ටිපර් හා පස්වැඩ, කැලෑ සුද්ධ කිරීම් ආදී වෙනත් සේවා සඳහා උපකරණවලට කුලී ගාස්තු නියම කර ගැනීමට හා නියම කර ගත් ගාස්තු අනුව කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් 1973 මැයි මස 11 වැනි දින පෙ. ව. 10.00 තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25/ ක් වයඹ දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ හෝ ඕනෑම වැඩ අධ්‍යක්ෂ කාර්යාලයක හෝ යාපනය, ත්‍රිකුණාමලය හෝ බදුල්ල යන දිසාපති කාර්යාලයක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 මැයි මස 10 වැනි දින පෙ. ව. 2.00 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. මේ සඳහා වැඩි විස්තර කුරුණෑගල නුවර පාරේ වයඹ දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වැඩ අධ්‍යක්ෂ—වයඹ දිසාව (කුරුණෑගල).

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
වයඹ දිසාව,
කුරුණෑගල,
1973 අප්‍රේල් මස 04 දින දී ය.

4–449—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**හිස් තාර බැරල්, හිස් වාණේ පීප්ප සහ සිමෙන්ති උර මිළයට ගෙන ඉවත් කර ගැනීමේ කොන්ත්‍රාත්තුව**

වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ දකුණු දිසා කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ ආයතනයන්ගෙන් පහත සඳහන් ද්‍රව්‍ය මිළයට ගෙන ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. කෙසේ වුවද, හික්කඩුව කොට්ඨාශයේ හිස් තාර බැරල් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන්නේ වැඩ අධ්‍යක්ෂ තැනගේ අභිමතය පරිදිය.

(i) හිස් තාර බැරල්
(ii) හිස් වාණේ පීප්ප
(iii) හිස් සිමෙන්ති උර

2. මගේ කාර්යාලයේ හෝ ගාල්ලේ හැර වෙනත් කච්චේරියක හෝ රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර එහි ලදුපත මා වෙත ඉදිරිපත් කළ විට 1973. 5. 15 දින ප. ව. 3.00 දක්වා මවිසින් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන අතර, 1973. 5. 23 දින පෙ. ව. 10.00ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කර එදින පෙ. ව. 10.30 ට මගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

3. රජයට සිය අභිමතය පරිදි කොන්ත්‍රාත් කාලය මසකින් හෝ ඊට වැඩි කාලයකින් දීර්ඝ කිරීමට ද බලය ඇතිව, කොන්ත්‍රාත්තුව හය මසක කාලපරිච්ඡේදයක් සඳහා වේ. ටෙන්ඩර්කරුවන්ගේ මිල ගණන් ටෙන්ඩර් විවෘත කළ දිනයේ සිට සති හතරකට වලංගු වනු ඇත.

මේ සම්බන්ධව වැඩි දුරටත් විස්තර ගාල්ලේ දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

කේ. වෙල්වරාජා,
වැඩ අධ්‍යක්ෂ වෙනුවට,
දකුණු දිසාව.

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
දකුණු දිසාව,
කොටුව,
ගාල්ල.
1973 අප්‍රේල් මස 7 දින දී ය.

4–442—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවා සංවිධානය—සබරගමුව**

කොළඹ නුවර පාරේ පූර්ව මිශ්‍රණ කලාලයක් ඇතිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රානුසාරයෙන් කැඩූ වර්ග කරන ලද 3/4" කැටගල් කියුබ් 650 ක් එම පාරේ 55 වැනි සැතපුමේ උතුවන් කන්දේ පිහිටි වැඩ පලට සපයා ප්‍රවාහණය කොට මුට්ට කර බාර දීම සඳහා ටෙන්ඩර් පත් දිසා වැඩ අධ්‍යක්ෂ (සබරගමුව) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1973 මැයි මස 11 වැනි සිකුරාදා පෙරවරු 11.00 වන තෙක් භාරගනු ලැබේ.

2. රඹුක්කන විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ටෙන්ඩර් ලිය කියවිලි පරීක්ෂා කළ හැකිය. දිසා වැඩ අධ්‍යක්ෂ (සබරගමුව) කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් සියයක් (රු. 100) තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කර රඹුක්කන විධායක ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම් කල විට මේ සඳහා ටෙන්ඩර්පත් ලබා ගත හැක.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබා ගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1973 මැයි මස 04 වැනි සිකුරාදා දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා ශ්‍රී ලංකාවේ වෙළඳ සහ අනිකුත් සමාගම්වලට සීමා කර තිබේ.

එස්. සෙල්වදුරෙයි,
දිසා වැඩ අධ්‍යක්ෂ,
සබරගමු දිසාව.

දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
රත්නපුරය, 1973 අප්‍රේල් මස 6 වන දින.

4–464—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**තැඹිලි පැළ සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම**

කළුතර දිස්ත්‍රික්කයේ, යටිපාත/තිනියාවල තරුණ ගොවි ව්‍යාපාරයට තැඹිලි පැළ සැපයීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ. 1973 ජූනි/ජූලි මාස් තුළ පැල 1,000 ක් ද 1973 ඔක්තෝබර් මාසය තුළ පැළ 1,000 ක් ද අවශ්‍ය වේ.

2. මෙම තැඹිලි පැළ නියම කරණ ප්‍රමාණ සහ දින අනුව තමන්ගේ වියදමින් ඉහත කී ව්‍යාපාරයට ප්‍රවාහනය කොට සැපයිය හැකි මිළ ගණන් 1973 මැයි මස 04 වැනි දින පස්වරු 2.00ට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි.

දිස්ත්‍රික් ඉඩම් නිළධාරී,
යටිපාත/තිනියාවල ව්‍යාපාරය, ඉඩම් ශාඛාව,
දිසාපති කාර්යාලය, කළුතර

3. මිළ ගණන් ඇතුළත් ලිපිය බහාලන කවරයේ වම් කෙළවරේ 'තැඹිලි පැළ සැපයීම සඳහා මිළ ගණන්' යනුවෙන් සඳහන් කළ යුතුයි.

4. වරකට පැළ ලොරි බරක් බැගින් ලබා ගැනීමට එකඟවනු ලැබේ. ව්‍යාපාරය දක්වා ලොරි යෑමට සුදුසු තාර දැමූ යහපත් මාර්ගයක් තිබේ.

5. මිළ ගණන් සැපයිය යුත්තේ මෙම දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පමණි. ඉල්ලුම් කරන අයට මෙම ආකෘති පත්‍ර නොමිලේ සපයනු ලැබේ.

නිව්ටන් පෙරේරා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

වර්ෂ 1973 ක් වූ අප්‍රේල් මස 03 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයේ දී ය.

4–461—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

**හිස් තාර පීප්ප සහ හිස් සිමෙන්ති මලු විකිනීම සහ ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් පත්**

වාරි මාර්ග, විදුලි බල හා මහා මාර්ග අමාත්‍යාංශයේ සබරගමුව දිසාවේ ප්‍රාදේශීය සේවා සිවිල් ඉංජිනේරු සංවිධානයේ ටෙන්ඩර් මංඩලයේ සභාපති තැන විසින්,

1. හිස් තාර පීප්ප

2. හිස් සිමෙන්ති මලු

විකිනීම සහ ඉවත්කර ගැනීම සඳහා ලාංකිකයන්ගන් සහ ලාංකික ආයතන වලින් පහත සඳහන් විධායක ඉංජිනේරු කොට්ඨාශ සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ රත්නපුර දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාශ,

(ආ) ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාශ.

ටැන්ඩර් කරුවන් විසින් ටැන්ඩර් පත රත්නපුර දිස්ත්‍රික්කයේ වෙනුවෙන් ද, නැතහොත් කෑගල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් ද යන බව නියත වශයෙන් සඳහන් කල යුතුය.

2. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වනුයේ 15. 05. 73 දින පෙ.ව. 10 ට වේ. ඉහත සඳහන් එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් රු. 100 ක මුදලක් මෙම කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු 2. 5 73 වන දින අ.භා. 2 ක වන තෙක් ටෙන්ඩර් පත් ලබා ගත හැක.

3. ටෙන්ඩර් විවෘත කිරීම 15. 5. 73 දින පෙ.ව. 11 ට සබරගමුව දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යයේදී සිදු කරනු ඇත. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමින සිටිය හැක.

4. කොන්ත්‍රාත්තුව 1973. 12. 31 දිනෙන් අවසන් වන කලයන් සඳහා වේ. වැඩි විස්තර රත්නපුරයේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැක.

එස්. සෙල්වදුරෙයි,
වැඩ අධ්‍යක්ෂ,
සබරගමුව දිසාව.

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
සබරගමුව දිසාව,
රත්නපුර, 1973. 4. 4.

4–471—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ 121 සීරී ණයවලින් වැය කරනු ලබන උස්සාන වාරිමාර්ග යෝජනා ක්‍රමවලට යන්ත්‍රෝප කරණ සැපයීම සඳහා ටෙන්ඩර්**

පහත සඳහන් යන්ත්‍රෝපකරණ වලින් එකක් හෝ සියල්ලම සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ, කොළඹ 1, තැ. පෙ. 500, වාරිමාර්ග, විදුලි බල හා මහා මාර්ග අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මෙසින් ටෙන්ඩර් කැඳවා සිටිනු ලැබේ.

| අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| (i) | 4 ඩබ්ලිව්. ඩී. වාහන—ජීප් රථ | 5 |
| (ii) | ගැලුම් 3 ධාරිතාවකින් යුත් අත් සීකරය (හැන්ඩ් ස්ප්‍රේයර්) | 45 |
| (iii) | පාම් ටැක්ටර් | 4 |
| (iv) | ඩෝසර් ඇඳුම් සහිත අශ්ව බල 150 ක්‍රෝලර් ට්‍රැක්ටර් | 1 |
| (v) | 8″ විෂ්කම්භයකින් යුත් පොම්ප | 6 |
| (vi) | 6″ විෂ්කම්භයකින් යුත් පොම්ප ... | 53 |
| (vii) | 8″ විෂ්කම්භයකින් යුත් දෘඪ පී.වී.සී. පයිප්ප හා සවිකුරු (පිරිංස්) | අඩි 1,00,000 |
| (viii) | මට්ටම් කිරීම සඳහා ග්‍රේඩර් | 2 |

2. මෙම ටෙන්ඩරය අනුව ඉදිරිපත් කරන සැපයුම් ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ සාමාජික රටක සහ ස්විට්සර්ලන්තයේ නිෂ්පාදකයින්ගෙන් හෝ සැපයුම්කරුවන්ගෙන් හෝ විය යුතුයි.

3. 1973 ජූලි මස 10 වන දින දක්වා ශ්‍රී ලංකාවේ, කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, තැ. පෙ. 1138, වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත රු. 50 ක් ගෙවා ලබාගත හැකි ආකෘති පත්‍රවල පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ. එය ශ්‍රී ලංකා රුපියල් වලින් මුදලින් හෝ මුදල් ඇණවුමකින් හෝ චැක් පතකින් හෝ බැංකු අණකරයකින් හෝ ගෙවිය යුතුය.

4. සියළුම ටෙන්ඩර් 1973 ජූලි මස 24 වන දින පෙරවරු 11.00ට පෙර ශ්‍රී ලංකාවේ කොළඹ, තැ. පෙ. 500, වාරිමාර්ග විදුලිබල හා මහා මාර්ග අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති වෙත ලැබෙන පරිදි ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් ඉදිරිපත් නොකරන විදේශීය නිෂ්පාදකයින් සහ/හෝ ප්‍රධානීන් වෙනුවෙන් බලයලත් ස්වදේශීය නියෝජිතයින් විසින් ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබේ නම්, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ 1973 ජූලි මස 24 වන දින පෙරවරු 11 ට පෙර ශ්‍රී ලංකාවේ, කොළඹ, ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ, වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ, ප්‍රධාන ගණකාධිකාරි එස්. සේනාධිරාජා මහතාට භාරදී එය භාරගත් බවට ඔහුගෙන් ලදු පතක් ලබාගත යුතුයි. සැපයීම් පිළිබඳ විස්තර හා ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ලිපිනයන් මුද්‍රා තබන ලද කවරයේ සඳහන් කල යුතුයි.

5. ශ්‍රී ලංකාවේ කොළඹ, ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ, වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපතිගේ කාර්යාලයේදී 1973 ජූලි මස 24 වන දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට හෝ ටෙන්ඩර් පත් විවෘත කරන විට සිටිය හැකිය.

6. ටෙන්ඩර් ආකෘතියේ සඳහන් කොන්දේසි හා ක්‍රමය අනුව ලන්සු තැබිය යුතුයි.

7. වැඩි විස්තර ශ්‍රී ලංකාවේ, කොළඹ 7, තැ. පෙ. 1138, බෞද්ධාලෝක මාවතේ වාරිමාර්ග අධ්‍යක්ෂගෙන් ලබාගත හැකිය.

පී. එච්. පෙරේරා,
වාරිමාර්ග අධ්‍යක්ෂ.

1973 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ 7, බෞද්ධාලෝක මාවත,
තැ. පෙ. 1138,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

4–465—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ගමනා ගමන මණ්ඩලය**

**පාවිච්චි නොකරන ලද අනවශ්‍ය සහ වැඩිපුර ඇති අමතර කොටස් විකිණීම**

රත්මලානේ ලං.ග.ම. අලෙවි මධ්‍යස්ථානයේ ඇති පාවිච්චි නොකරන ලද අනවශ්‍ය අමතර කොටස් මිලදී ඉවත් කර ගැනීම සඳහා කොළඹ 5 හේ අංක 200 කිරුළ පාරේ ලංකා ගමනා ගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් පහත සඳහන් කරන ලද දිනයන් හි පෙරවරු 10 දක්වා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| වර්ගය | අවසන් දිනය |
|---|---|
| 1. බෙඩ්ෆෝඩ් අමතර කොටස් | 73. 05.11 |
| 2. ඇල්බියන් අමතර කොටස් | 73. 05. 25 |
| 3. ගයි, ගාඩ්නර්, ඉන්ටනැෂනල් අමතර කොටස් ... | 73 05. 31 |

ටෙන්ඩර් තැන්පත් මුදල රු. 100 යි. ඉහත විස්තර කෙරෙන ටෙන්ඩර් තැන්පත් මුදල සහ ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවට රු. 25 බැගින් වූ මුදල් ගෙවීමෙන් පසු මෙම කාර්යාලයේ දී ඉහත සඳහන් ටෙන්ඩර් අවසාන දිනට පෙර දිනයන් හි පස්වරු 3 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

විකිනීම සඳහා නියමිත අමතර කොටස් සාමාන්‍ය වැඩ කරන වේලාවලදී රත්මලානේ අපහරණ මධ්‍යස්ථානයේ දී පරීක්ෂා කල හැක. වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන.

සම්පාදක කොට්ඨාශය,
වේරහැර.

4 547—73 04 19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ ක් ඇතුළත් වනසේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිල ගණන් දැක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීමට අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිලට මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ. යම්කිසි අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ:—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වූවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත් කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලෙන් සලාක සහල් මිලේත් වෙනස අඩු කරනු ලැබේ.

වෛද්‍ය. ඒ. අරුමෛසිනායගම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, මාතලේ.

1973 අප්‍රේල් 4 වැනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

4–479—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, යූනියන් පෙදෙසේ විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 560, කොළඹ) මෙරට නිෂ්පාදිත නයිලෝන් කොට් සහ දිග මේස් සැපයීම සඳහා 1973 මැයි මස 15 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 මැයි මස 14 වැනි සඳුදා පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් ෆෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

4–580—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

උපලේඛනය

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| (1) මෙරට නිෂ්පාදිත සුදු කපු මේස රෙදි (ටෙබිලින්) සැපයීම ... | 1973.5.11 |
| (2) මෙරට නිෂ්පාදිත නිලධාරි මෝස්තරයේ රබර් මිශ්‍ර වැහි කබා සැපයීම | 1973.5.11 |

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක් ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් ෆෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 අප්‍රේල් මස 19 දින,
කොළඹ දී ය.

4–541—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

## වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පරිපාලනයට අයත් ගොඩනැගිලි අළුත් වැඩියා කිරීම් සඳහා ටෙන්ඩර්පත්

වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පරිපාලනයට අයත් ගොඩනැගිලි අලුත් වැඩියා කිරීම සඳහා 1973 මැයි මස 10 වැනි දින පෙ. ව. 10.30 දක්වා වවුනියා කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් රු. 10,000 (දහදාහකට) හෝ ඊට වැඩි ප්‍රමාණයක ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

2. 1973 මැයි මස 03 වැනි දින දහවල් 12 තෙක් වවුනියා කච්චේරියේදී ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝරම අපේක්ෂකයන් විසින් ඉහත සඳහන් වැඩ වෙනුවෙන් රු. 25 ක මුදලක් වවුනියා කච්චේරියේදී තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් වවුනියා දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. ග්‍රාමසංවර්ධන සමිති, සමූපකාර සමිති සහ කම්කරු සමිති ටෙන්ඩර් ෆෝරම සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

4. 1973 මැයි 10 වැනි දින පෙ. ව. 10.30 ට වවුනියා කච්චේරියේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩර් ෆෝරම සම්පූර්ණ කර පිටපත් 2 කින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවනු කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් පස උඩ කෙළවරේ වැඩයේ නම ලියා තැබිය යුතුය. ටෙන්ඩර් ෆෝරම ලේඛනගත තැපෑලෙන් නොඑවන්නේ නම්, වවුනියා කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි, පැමිණ බහා ලිය හැකිය.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කරන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

7. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් කළ විට, වවුනියා දිසාපතිගෙන් ලබා ගත හැකිය.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිසාපති.

1973 අප්‍රේල් මස 09 දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දීය.

4–575—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

### වවුනියා දිස්ත්‍රික්කයේ මූලතිව් නානායමේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම

වවුනියා දිස්ත්‍රික්කයේ, ඉහත සඳහන් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා 1973 මැයි මස 10 වැනි දින පෙරවරු 10.30 දක්වා වවුනියා කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් රු. 25,000 කට (රුපියල් විසිපන්දහකට) හෝ ඊට වැඩි ප්‍රමාණයක ගොඩනැගිලි ඉදි කිරීම සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. 1973 මැයි මස 03 වැනි දින දවල් 12 තෙක් වවුනියා කච්චේරියේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයන් විසින් ඉහත සඳහන් වැඩ වෙනුවෙන් රු. 25ක මුදලක් වවුනියා කච්චේරියේ දී තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් වවුනියා දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, සමුපකාර සමිති සහ කම්කරු සමිති ටෙන්ඩර් පෝර්ම සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් භාර ගනු නොලැබේ.

4. 1973 මැයි මස 10 වැනි දින පෙ. ව. 10.45ට වවුනියා කච්චේරියේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් පස උඩ කෙළවරේ වැඩයේ නම ලියා තැබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම ලේඛනගත තැපෑලෙන් නොඑවන්නේ නම්, වවුනියා කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි, පැමිණ බහාලිය හැකිය.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතු අතර, එවැනි කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ, වැඩ කරන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

7. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් කළ විට, වවුනියා දිසාපතිගෙන් ලබා ගත හැක.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිසාපති.

1973 අප්‍රේල් මස 09 වැනි දින,
වවුනියා දිසාපති කායසීලයේ දී ය.

4–575—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

#### සවිගැන්වූ කොන්ක්‍රීට් කණු 1000ක් සැපයීම

පහත දැක්වෙන විශේෂ විස්තරය අනුව සවිගැන්වූ කොන්ක්‍රීට් කණු සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1973.05.04 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**විශේෂ විස්තරය :**

කණු 1000 : ඉ.සං.දෙ. සැලසුම් අංක 1052 අනුව ¼" විෂ්කම්භය ඇති මෘදු වානේ කම්බි 4 ක් සහිත අතරතුර පරතරය අඟල් 6 වනසේ 3/16" විෂ්කම්භය ඇති කම්බියෙන් නවා පිළියෙල කරන ලද කම්බි වලලු ද (ස්ටරප්ස්) යොදා 6" × 6" ප්‍රමාණයේ ශක්ති වර්ධන කණු 1 : 2 : 4 (¾") කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් සාදා සැපයීමට.

2. 1973.05.03 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 50 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

4. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "සවිගැන්වූ කොන්ක්‍රීට් කානු සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදිය යුතුයි.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

6. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳවම සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේය.

8. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාතීමේන්තුවේදී 1973.05.03 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

10. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සිපී/2/451,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ,
1973 අප්‍රේල් 10 වන දින,

4–539—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### තැපල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව ග්‍රේපල්ට් චාර්ජස් සැපයීම සහ ගෙනවිත් භාරදීම

ග්‍රේපල්ට් චාර්ජස් සැපයීම සඳහා කොළඹ 1, ලෝටස් පාරේ තැපල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ 6 වෙනි මහලේ තැපල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ ගැනුම්පත් මණ්ඩලයේ සභාපති විසින් 1973 මැයි මස 24 වෙනි දින පෙ.ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, ලෝටස් පාරේ තැපල් සහ විදුලි සන්දේශ මූලස්ථානයේ 5 වෙනි මහලේ ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කායසීලයෙන් ලබාගත් පෝර්ම පිටපත් දෙකකින්, යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කල යුතුයි. ඉහත සඳහන් කායසීලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

3. කොළඹ 1, මධ්‍යම විදුලි පනිවිඩ කායසීලයේ විදුලි පනිවිඩ කැෂියර් වෙත හෝ තැපැල් කායසීලයක ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කායසීලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1973 මැයි මස 15 වෙනි දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගත හැකිය.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්මාස්ටර් ජනරාල් සහ
විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

පාලන අංශය,
6 වෙනි මහල,
තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථානය,
ලෝටස් පාර,
කොළඹ 1.

4–544—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

### ටෙන්ඩර් දැන්වීමයි

රුවන්වැල්ල කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයට ලගාවන පාර සහ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ මිදුල ඉදිකිරීම සඳහා රු. 25,000 කට වැඩියෙන් මහාමාර්ග වැඩකටයුතු සඳහා රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල ලියාපදිංචි වූ කොන්ත්‍රාත්තුකරුවන්ගෙන් සීල් තැබූ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය : 1973 මැයි 08 වැනි අඟහරුවාදා ප. ව. 2.00 දක්වා.

ටෙන්ඩර් පෝර්ම පත්‍ර නිකුත් කරන අවසාන දිනය : 1973 මැයි 07 වැනි සඳුදා පස්වරු 3.00 දක්වා.

පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කිරීමෙන්, ටෙන්ඩර් පෝර්ම පත්‍ර, කොළඹ 5, නාරාහේන්පිට, ජාතික කිරි මණ්ඩලයේ, කිරි සකස් කිරීමේ කර්මාන්ත ශාලාවේ ඉංජිනේරු අංශයෙන් ලබාගත හැකිවේ.

1. ලියාපදිංචි සහතිකය

2. රු. 50 ක් වූ ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතුව මුදලින් ගෙවීමේ කුවිතාන්සිය.

ටෙන්ඩර්පත් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළයුතු අතර, ඉහතින් නියමකර ඇති පරිදි රජයේ දෙපාර්තමේන්තුවල සහ රාජ්‍ය සංස්ථාවල ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ටෙන්ඩර් පෝර්ම පත්‍ර නිකුත් කරනු ලැබේ.

මේ පිළිබඳව වැඩිමනත් විස්තර, කොළඹ 5, නාරාහේන්පිට, ජාතික කිරි මණ්ඩලයේ කිරි සකස් කිරීමේ කර්මාන්ත ශාලාවේ ඉංජිනේරු අංශයෙන් ලබාගත හැකිවේ.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
නාරාහේන්පිට,
කොළඹ 5.
1973 අප්‍රියෙල් 06 දින.

4-552—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

## තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම්

### ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1973 ජනවාරි මස 19 වන දින අංක 34 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වෙනි කොටස (II අ) හි පළ කරණ ලද ආහාර පාන සැපයීමේ ටැන්ඩර් ප්‍රතිඵල පහත දක්වේ.

| ලැබුණ ටෙන්ඩර් පත් ගණන | සැපයීම | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම |
|---|---|---|
| 03 ... | එළවලු, පොල්, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය, මස්, මාලු, වියලි සලාක සහ උදය ආහාර | එච්. ඩබ්ලිව්. නීලවීර මයා., ආමි ඇන්ඩ් නේවි ස්ටෝර්ස් බාරේ, දියතලාව |

ඉහත ප්‍රකාර පිරිනමන ලද කොන්ත්‍රාත්තුව සම්බන්ධ මිළ ගණන් කොළඹ බාලදක්ෂ මාවතේ පිහිටි යුද හමුද මූලස්ථානයෙන් දැන ගැනීමට හැකි බව මෙයින් දන්වා සිටිමි.

මේජර්-ජනරාල්,
යුද්ධ හමුදාධිපති.

1973 අප්‍රේල් මස 5 වැනි දින,
යුද්ධ හමුද මූලස්ථානය,
බාල දක්ෂ මාවත,
තැ.පෙ. 553,
කොළඹ.

4-475—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම්

### පරණ ගුදිරි, පරණ මදුරු දැල්, හිස් තෙල් ටින් සහ වෙනත් බඩු වෙන්දේසියක්

වර්ෂ 1973 අප්‍රේල් මස 30 වැනි දින පෙ. ව. 9 ට පරණ ගුදිරි, පරණ මදුරු දැල්, හිස් තෙල් ටින් සහ වෙනත් පාවිච්චි නොකළ හැකි බඩු මිරිහාන පොලිසිය අසල පිහිටි නුගේගොඩ කොට්ඨාශයේ පොලිස් බඩු ගබඩාව අසලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියට පෙර තෙදින තුළ එකී බඩු ඉහත කී ගබඩාවේ දී පරීක්ෂා කිරීමට ඉඩදෙනු ලැබේ. වෙන්දේසිය අවසානයේදී ලබා ගත් බඩු වෙනුවෙන් මුදල් ගෙවා එම බඩු ගෙනයාමට හැකිවේ.

පොලිස් අධිකාරි, නුගේගොඩ.

1973 අප්‍රේල් මස 02 වැනි දින,
පොලිස් කාර්යාලය, නුගේගොඩ.

4-462—72.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

### මාතලේ මහේස්ත්‍රාත් උසාවිය

මාතලේ මහේස්ත්‍රාත් උසාවියේ රාජසන්තක කරන ලද හා අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් භාණ්ඩ 1973 මැයි මස 4 දින පෙ. ව. 8.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

බඩු මිලදී ගනු ලබන්නන් විසින් එවේලේම මුදල් ගෙවා භාණ්ඩ ඉවත් කරගත යුතුයි.

ඩබ්. ඇන්. බී. එම්. විල්ප්‍රඩ්,
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්.

1973 අප්‍රේල් මස 6 දින,
මාතලේ මහේස්ත්‍රාත් උසාවියේදී ය.

| නඩු අංකය | | භාණ්ඩය පිළිබඳ විස්තර |
|---|---|---|
| 1. 41664 | ... | උදළු 1 යි, කුඩා 1 යි. |
| 2. 41665 | ... | උදළු 1 යි. |
| 3. 41662 | ... | කුඩා 1 යි. |
| 4. 41663 | ... | කුඩා 1 යි. |
| 5. 41666 | ... | උදළු 1 යි, කුඩා 2 යි. |
| 6. 41669 | ... | උදළු 1 යි, කුඩා 3 යි. |
| 7. 41671 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 1 යි. |
| 8. 41668 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 1 යි. |
| 9. 41659 | ... | උදළු 1 යි, සල්ලඩ 1 යි, කුඩා 1 යි. |
| 10. 41660 | ... | කුඩා 2 යි. |
| 11. 41670 | ... | උදළු 1 යි, සල්ලඩ 1 යි, කුඩා 1 යි. |
| 12. 41672 | ... | අලවංගු 1 යි, කුඩා 1 යි. |
| 13. 41673 | ... | උදළු 1 යි, කුඩා 3 යි. |
| 14. 41573 | ... | විල්බැරෝ 1 යි, කුඩා 2 යි, උදළු 1 යි. |
| 15. 41571 | ... | උදළු 1 යි, කුඩා 1 යි. |
| 16. 41572 | ... | උදළු 1 යි, කුඩා 1 යි, බාල්දි 1 යි. |
| 17. 41569 | ... | බාල්දි 1 යි, කුඩා 2 යි. |
| 18. 41568 | ... | කුඩා 2 යි, උදළු 1 යි. |
| 19. 41570 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 2 යි. |
| 20. 41447 | ... | උදළු 1 යි, කුඩා 2 යි. |
| 21. 41397 | ... | උදළු 1 යි, අලවංගු 2 යි, කුඩා 2 යි. |
| 22. 41399 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 5 යි. |
| 23. 41398 | ... | උදළු 1 යි, කුඩා 6 යි. |
| 24. 41446 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 2 යි. |
| 25. 41445 | ... | උදළු 2 යි, කුඩා 2 යි, අලවංගු 2 යි. |
| 26. 41444 | ... | උදළු 1 යි, බාල්දි 1 යි, අලවංගු 1 යි, කුඩා 4 යි. |
| 27. 39385 | ... | කැති 1 යි. |
| 28. 41293 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 1 යි. |
| 29. 41292 | ... | බාල්දි 1 යි, අලවංගු 1 යි, කුඩා 1 යි. |
| 30. ඒ. ආර්. 38/73 | | උදළු 1 යි, බාල්දි 1 යි, කුඩා 2 යි. |
| 31. 36347 | ... | පිහිය 1 යි, යකඩ පොලු 1 යි, ටෝච් ලයිට් 1 යි. |
| 32. 41504 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 1 යි. |
| 33. 41507 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 1 යි. |
| 34. 41505 | ... | උදළු 1 යි, බාල්දි 1 යි, කුඩා 1 යි. |
| 35. 35064 | ... | උදළු 1 යි, අලවංගු 2 යි, කුඩා 1 යි. |
| 36. 35068 | ... | උදළු 1 යි, අලවංගු 1 යි, කුඩා 1 යි. |
| 37. 35067 | ... | උදළු 1 යි, අලවංගු 2 යි, කුඩා 1 යි. |
| 38. 35066 | ... | අලවංගු 1 යි, කුඩා 1 යි. |

| නඩු අංකය | භාණ්ඩය පිළිබඳ විස්තර |
|---|---|
| 35 ඒ. ආර්. 486/72 | කප්පාදු පිහියා 1 යි. |
| 36. 38199 ... | උදලු 2 යි. |
| 37. 36964 ... | උදල් 1 යි, අලවංගු 1 යි. |
| 38. 36472 ... | ඇලුමිනියම් මුට්ටි 1 යි. |
| 39. 32272 ... | කැති 1 යි. |
| 40. 25558 ... | කැති 1 යි. |
| 41. 18327 ... | කැති 1 යි. |
| 42 37206 ... | උදළු 4 යි, මුල්ලු 1 යි. |
| 43. 35505 ... | අලවංගු 1 යි, කොහු 1 යි, ලන්තෑරුම් 1 යි, ගිලට් රේසර් පෙට්ටි 1 යි, කෝට් 1 යි. |
| 44. 28390 ... | සූට්කේස් 1 යි. |
| 45. 11331 ... | සූට් කේස් 1 යි. |
| 46 30465 ... | කප්පාදු පිහියා 1 යි. |
| 47. 39432 ... | සයිකල් සීට් 1 යි, සයිකල් සිම් 1 යි. |
| 48. 32274 ... | කැති 1 යි. |
| 49. 36607 ... | පිහියා 1 යි. |
| 50. 31164 ... | ඔර්ලෝසු 1 යි. |
| 51. 27390 ... | රේඩියෝ වැලිපත් කත් අංක 7181. |
| 52. 27793 ... | කුඩා 4 යි, උදළු 4 යි, අලවංගු 2 යි, වතුර පොම්ප 2 යි, හෝස් පයිප්ප 3 යි. |
| 53. 27306 ... | මේස් කුට්ටන් 1 යි, ජර්සි 1 යි, කළු කලිසන් 1 යි, තන්දන කලිසන් 1 යි, හෙන්වලි ෂර්ට් 1 යි, ලේන්සු 1 යි, සපත්තු කුට්ටම් 1 යි, බැනියන් 1 යි, රෙදි යාර 1 යි, කැන්ඩි ෂර්ට් 1 යි. |

ම. උ. දඹුල්ල

| නඩු අංකය | භාණ්ඩය පිළිබඳ විස්තර |
|---|---|
| 1. ඒ/448/69—සී.වී—2789 | පාපැදි 1 යි. |
| 2. | බී එන්. 1967 දරණ පාපැදි 1 යි. |
| 3. ... | ඩී. කේ. 75120 දරණ පාපැදි 1 යි. |
| 4. ... | ඩී. බී. 2192 දරණ පාපැදි 1 යි. |
| 5. ... | ඒ. ඊ. 98690 දරණ පාපැදි 1 යි. |
| 6. ... | ඒ 30493 දරණ පාපැදි 1 යි. |
| 7. ඒ. ආර්. 113/71 | බී. එම්. 2234 රැලේ බයිසිකල් ෆ්‍රේම් 1 යි. |
| 8. ඒ ආර්. 113/71 | ඒ. එල්. 3064 දරණ රැලේ පාපැදි ෆ්‍රේම් 1 යි. |
| 9. ... | බී. ජී. 2430 දරණ පාපැදි ෆ්‍රේම් 1 යි. |
| 10. ඒ 72/73 | පාපැදියක කොටස් :— (1) කොග්වීල් 1 යි, (2) මඩ ආවරණ 2 යි, (3) ඇන කීඹිප සකී, (4) චේන් කවරයක්, (5) පාපැදියක හැඩලයක්, (6) පෝර්ක් අතක්, (7) ඩයිනමෝ ලාම්පුවක්, (8) පාපැදි ෆ්‍රේම් එකක් අංක 445. |
| 11. ඒ. 39/73 ... | පොල් ගෙඩි 6 ක් සහිත පන් මල්ලක්. |
| 12. 18577 ... | (1) ඇක්සයිස් පොත් 43 යි. (2) පවුන්වන් පැන් 6 යි. (3) පාකර් පවුන්වන් පැන් 6 යි. (4) ප්ලැටිනම් පවුන්වන් පැන් 5 යි. |
| 13. 21541 ... | නියන් 1 යි, කැලි දෙකේ විදුලි පන්දම් 1 යි. |
| 14. 21994 ... | බේසම් 1 යි. |
| 15. 21503 ... | අත් සහිත පොරෝ 1 යි. |
| 16 21523 ... | බිස් චරන් ක් පෙට්ටි 2 යි. |
| 17. 21286 ... | පාපැදි ස්ටෑන්ඩ් 1 යි. |
| 18. 20298 ... | උදළු 1 යි. |
| 19. 19370 ... | උදළු 1 යි. |
| 20 19868 ... | පුටු 1 යි, උදළු 1 යි. |
| 21. 20068 ... | කැති 1 යි. |

4–518 –73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රසිද්ධ වෙන්දේසිය

**ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවිය—කොටුව, කොළඹ**

මෙම උසාවියේ නඩුවලට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයක් 1973 මැයි මස 5 වැනි දින පස්වරු 12.45ට උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට මහජනයාට මෙයින් දැනුම් දෙමි.

එදින දවල් 12 සිට එම භාණ්ඩ බලා ගැනීමට ඉඩ සලසනු ලැබේ.

විකිණීමට නියමිත භාණ්ඩ වල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට පෙර උසාවි දැන්වීම් පුවරුවේ පළකරනු ඇත.

සී. මනෝහර,
මහෙස්ත්‍රාත්, කොටුව.

1973 අප්‍රේල් මස 7 වැනිදා,
කොළඹ, කොටුව ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවියේ දිය.

4–579—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

### දුම්රිය දෙපාර්තමේන්තුව

**ප්‍රසිද්ධ වෙන්දේසියක්**

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පාවිච්චි කරන ලද ජයර්, වියුඹ, හිස් ටින්, රෙදිපිළි යනාදියෙන් යුත් බඩු තොගයක් මරදාණේ දුම්රිය ගබඩාවේ දී, 1973 මැයි මස 08 වෙනි දින පෙ. ව 9. ට වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිපුර විස්තර මරදාණේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබා ගත හැක.

4-540—73.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**වවුනියා දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම—1973/74**

**1973 ජූලි මස 1 සිට 1974 ජූනි මස 30 දිනු දක්වා කාලය සඳහා**

1973 ජූලි මස 1 දින සිට 1974 ජූනි මස 30 දක්වා වූ කාලය සඳහා වවුනියා දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍රයන්ට අදාළ කොන්දේසි මාලාවට යටත්ව 1972 ඔක්තෝබර් 31 වැනි දින ප්‍රකාශයට පත් අංක 31/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව, ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. පහත දක්වා ඇති උප ලේඛණයේ සඳහන් කර ඇති වේලාවට කලින් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත "1973–74 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද මිලයට ගැණීමේ ටෙන්ඩරය " යි සඳහන් කර 1973 මැයි මස 3 වැනි දිනට හෝ ඊට ප්‍රථම එවිය යුතුය.

3. එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුයි. තවද, එක් අයෙකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩර යකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහිකව ටෙන්ඩරයක් එවිය හැකියි.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ :—

(අ) ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණියහොත්,

(ආ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි ව්‍යිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුය. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැතිවූද, ටෙන්ඩරයේ දක්වෙන මුදල් ප්‍රමාණයෙන් සියයට 25කට අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණා ඇත්තාවූද, ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩර් පත්‍රයක් සමඟ වත්කම් සහතිකයේ මුල් පිටපත් අමුණා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩර් වලට එම සහතිකයේ සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදාළ තැබෑරුමේ පිහිටීම, නම සහ අංකය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ වවුනියාව දිසාපතිතුමාට හෝ එතුමාගේ කාර්යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාර දිය හැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවර ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි, තැබෑරුමේ නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමඟම රු. 1,000 කට කච්චේරි කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සියළුම තැන්පත් කිරීම් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවූවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ටෙන්ඩර් පත්‍ර ලබාගත් නමුත්, ටෙන්ඩර් ඉදිරිපත් නොකළ අය, ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ඉල්ලීමේ දී මුලින් ලබාගත් ටෙන්ඩර් පත්‍ර ආපසු භාර දිය යුතුය.

8. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය වවුනියාව දිසාපතිතුමා සතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු රා රේන්ද මිළට ගත් ලෙස ප්‍රකාශයට පත් කළ වහාම වවුනියාව දිසාපති තුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසපති තුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා වෙනත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

10. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම් පවත්වාගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපතිතුමාට දැන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබාගත යුතුය. අංක 4 දරණ පුදුකුඩියිරිප්පුවේ පිහිටා ඇති තැබෑරුම හා අංක 7 වවුනියාවේ පිහිටා ඇති තැබෑරුම දැනට තිබෙන ස්ථානයෙහි නම්, මේ වසරට වලංගු නොවේ.

11. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කාර්යාලයට ලියා විමසන්න.

### උප ලේඛනය

| අංකය හා ප්‍රදේශය | තැබෑරුම පිහිටි පළාත් පාලන කොට්ඨාශය | ටෙන්ඩරය භාරගන්නා අවසන් වේලාව |
|---|---|---|
| 1. මුලතිවු ... | මුලතිව් සුළු නගර සභාව... | පෙ.ව. 10.00 |
| 3. මුල්ලියාවලෙයි | මුල්ලියාවලෙයි ගම් සභාව | පෙ.ව. 10.15 |
| 4. පුදුකුඩියිරිප්පු ... | පුදුකුඩියිරිප්පු ගම් සභාව... | පෙ.ව. 10.30 |
| 5. පුදුමාතලන් ... | පුදුමාතලන් ග්‍රාමය ... | පෙ.ව. 10.45 |
| 7. වවුනියාව ... | වවුනියාව නගර සභාව ... | පෙ.ව. 11.00 |
| 8. කච්චිලාමඩු ... | කච්චිලාමඩු ග්‍රාමය ... | පෙ.ව. 11.15 |
| 9. වට්ටුවාගල් ... | වට්ටුවාගල් ග්‍රාමය ... | පෙ.ව. 11.30 |

එස්. සිවඥනම්,
අතිරේක දිසාපති,
වවුනියා දිසාපති වෙනුවට.

1973 අප්‍රේල් මස 02 වැනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේ දීය.

4–574—73.04.19 දින අංක 56 දරණ හැසට් පත්‍රය

## ගැසට් පත්‍රය-පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| අප්‍රේල් ... | 73. 4. 6 සිකුරාද ... | 73. 3.28 බදාද | දවල් 12.00 |
| | 73. 4.11 බදාද ... | 73. 4. 4 බදාද | දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්ද ... | 73. 4.11 බදාද | දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද ... | 73. 4.18 බදාද | දවල් 12.00 |
| මැයි ... | 73. 5. 4 සිකුරාද ... | 73. 4.25 බදාද | දවල් 12.00 |
| | 73. 5.11 සිකුරාද ... | 73. 5. 2 බදාද | දවල් 12.00 |
| | 73. 5.18 සිකුරාද ... | 73. 5. 9 බදාද | දවල් 12.00 |
| | 73. 5.25 සිකුරාද ... | 73. 5.15 අඟහරුවාද | දවල් 12.00 |
| ජූනි | 73. 6. 1 සිකුරාද ... | 73. 5.23 බදාද | දවල් 12.00 |
| | 73. 6. 8 සිකුරාද ... | 73. 5.30 බදාද | දවල් 12.00 |
| | 73. 6.14 බ්‍රහස්පතින්ද ... | 73. 6.6 බදාද | දවල් 12.00 |
| | 73. 6.22 සිකුරාද ... | 73. 6.13 බදාද | දවල් 12.00 |
| | 73. 6.29 සිකුරාද ... | 73. 6.20 බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.